SriLankan Airlines

oneworld

# වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යංශය

ශ්‍රීලංකන් ගුවන් සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කටුනායක, ශ්‍රී ලංකාව

**ප්‍රසම්පාදන අංකය : ENG/ALC/RFP/22/030-1 & ENG/ALC/RFP/22/030-2**

**ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් පටු බඳ ගුවන්යානා පහක් (05) සහ පුළුල් බඳ ගුවන්යානා පහක් (05) මෙහෙයුම් කුලී පදනම මත ලබාගැනීමට යෝජනා කැඳවීම**

ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙනුවෙන් මෙහෙයුම් කුලී පදනම මත සුදුසු ගුවන්යානා සැපයීමට සුදුසුකම් ලත් සහ අවසරලත් ලංසුකරුවන්ගෙන් වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යංශයේ අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් ලංසු කැඳවනු ලැබේ. අදාළ යෝජනා සඳහා ඉල්ලීම (RFP) ශ්‍රීලංකන් ගුවන් සමාගමේ නිල වෙබ් අඩවිය (**https://www.srilankan.com/en_uk/corporate/tender-notices**) වෙතින් 2022 දෙසැම්බර් 19 වැනිදා සිට ලබාගත හැක.

මෙම ලංසු කැඳවීම සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගතව අන්තර්ජාතික තරඟකාරී ලංසු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගිනි. ගුවන්යානා කල්බදු පදනම මත ලබාදීමට නීතිමය අවසර ඇති සියලු ලංසුකරුවන්ට **asset@srilankan.com** යන විද්‍යුත් ලිපිනය හරහා තම ලංසු ඉදිරිපත් කළ හැක. ලංසු ඉදිරිපත් කිරීමේදී අදාළ යෝජනා සඳහා ඉල්ලීම් පරිශීලන කේතයවන ENG/ALC/RFP/22/030-1 හෝ ENG/ALC/RFP/22/030-2 යොදා 2023 ජනවාරි 30 වැනි දින (ලංසු භාරගන්නා අවසාන දිනය) ශ්‍රී ලංකා වේලාවෙන් පැය 1400ට පෙර (GMT +0530) අදාළ ලංසු ලැබීමට සැලැස්විය යුතු ය.

අදාළ ලංසු භාරගැනීමේදී පහත සඳහන් ලේඛන තිබීම අත්‍යවශ්‍ය වේ.

- ලංසුකරුගේ විස්තරය
- ගුවන්යානා කල්බදු පදනම මත ලබාදීමට ගුවන්යානා හිමිකරු විසින් ලංසුකරුට ලබාදෙන අවසරය සහ ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසි මත ශ්‍රීලංකන් ගුවන් සමාගම සමඟ කල්බදු ගිවිසුමකට එළඹීමට ගුවන්යානා හිමිකරුගේ එකඟතාව
- දැනට පවත්නා මූල්‍ය ගනුදෙනු/ උකස්තැබීම්/ හිමිකම් ආදී ගුවන් යානය පිළිබඳ තොරතුරු (ගුවන්යානය දැනට උකස් තැබීමකදී පවතී ද යන්න ආදිය)

නිවැරදිව සම්පූර්ණ කරන ලද ලංසු කැඳවීමේ පත්‍රිකාව, යෝජනා සඳහා ඉල්ලීම (RFP) සමඟ අමුණා **praneeth.alwis@srilankan.com** යන විද්‍යුත් ලිපිනයට පිටපත් කර, **umega.seneviratne@srilankan.com** යන විද්‍යුත් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතු ය. යෝජනා සඳහා ඉල්ලීමට අදාළ යම්කිසි විමසීමක් වෙතොත්, **praneeth.alwis@srilankan.com** යන විද්‍යුත් ලිපිනය පිටපත් කර, **umega.seneviratne@srilankan.com** යන විද්‍යුත් ලිපිනය වෙත 2023 ජනවාරි 16 දිනට හෝ ඊට පෙර යොමුකළ හැක.

ලංසු 2023 ජනවාරි 30 වැනිදා ශ්‍රී ලංකා වේලාවෙන් පැය 1415ට (GMT+0530) ඉලෙක්ට්‍රොනිකව විවෘතවන අතර, ඒ පිළිබඳ යම් වෙනස්වීමක් වෙතොත් (RFP) අතිරේකයක් මගින් දැනුම් දෙනු ලැබේ. ප්‍රමාද වී ඉදිරිපත් කෙරෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු කැඳවීමට සහභාගීවීමට අපේක්ෂාකරන පාර්ශ්ව ඒ පිළිබඳව ලංසු විවෘත කිරීමට දින හතකට (7) පෙර ඒ බව **praneeth.alwis@srilankan.com** යන විද්‍යුත් ලිපිනය පිටපත් කර, **umega.seneviratne@srilankan.com** යන විද්‍යුත් ලිපිනය වෙත දැනුම් දිය යුතු ය.

යෝජනා සඳහා ඉල්ලීමට අදාළ යම් සංශෝධනයක්/ දැනුම්දීමක් වෙතොත් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ නිල වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ.

**සභාපති**
**අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**
**වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යංශය**
**අංක 19, චෛත්‍යය පාර, කොළඹ 01, ශ්‍රී ලංකාව**